# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## එකතුකළ අගය මත බද්ද

### 2011 දෙසැම්බර් මාසය සඳහා වාර්තාව සැපයීම සහ ගෙවීම් කිරීම
### 2011 දෙසැම්බර් 31 න් අවසන් වන කාර්තුව සහ අර්ධ වර්ෂය සඳහා වාර්තාව සැපයීම

1. **එකතුකළ අගය මත බදු වාර්තා මාසිකව ඉදිරිපත් කරන බදු ගෙවන්නන්**
   **(ශුන්‍ය අනුප්‍රමාණගත සැපයුම්කරුවන්)**
   - ❖ ගෙවීම් කළ යුතු සහ වාර්තා ඉදිරිපත් කළ යුතු අවසාන දිනය 2012.01.20

2. **එකතුකළ අගය මත බදු වාර්තා ත්‍රෛයිමාසිකව ඉදිරිපත් කරන බදු ගෙවන්නන්**
   - ❖ 2011.12.31 දිනෙන් අවසන් වන කාර්තුව සඳහා වාර්තාව ඉදිරිපත් කිරීම සහ එම කාර්තුව සඳහා එකතුකළ අගය මත බද්දේ අවසාන මාසික වාරිකය ගෙවිය යුතු අවසාන දිනය 2012.01.20

3. **මූල්‍ය සේවාවන් සපයනු ලබන බදු ගෙවන්නන් (මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද)**
   - ❖ 2011.12.31 දිනෙන් අවසන් වන අර්ධ වර්ෂය සඳහා
     - එකතුකළ අගය මත බද්දේ අවසාන මාසික වාරිකය ගෙවිය යුතු අවසාන දිනය 2012.01.20
     - වාර්තාව ඉදිරිපත් ඉදිරිපත් කළ යුතු අවසාන දිනය 2012.01.31
   - ❖ මූල්‍ය සේවාවන් මත එකතු කළ අගය මත බද්ද ගෙවීමට යටත්වන සෑම තැනැත්තෙකුගෙන්ම එවැනි මූල්‍ය සේවා අගය වැඩි කළ (මූල්‍ය සේවාවන් මත එකතු කළ අගය මත බදු ගෙවීමේ කාර්ය සඳහා ගණනය කරන ලද) වටිනාකමින් 8% කට සමාන ප්‍රමාණයක්, එම තැනැත්තා විසින් එම ආයතනයේ ස්ථාපනය කළ යුතු ආයෝජන අරමුදල් ගිණුමේ තැන්පත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

**<u>සටහන:</u>**

➢ 2011.01.01 දින හෝ එදිනට පසුව සිදුකරනු ලැබ ඇති ඕනෑම වලංගු ඉල්ලීමක් මත, එකතු කළ අගය මත යෙදවුම් බදු බැර, යම් බදු ඉන්වොයිසියක් හෝ රේගු ප්‍රකාශනයකට අදාලව නිමැවුම් බද්දෙන් 100% ක් දක්වා පමණක් අඩු කළ හැකිය.

➢ 2010.12.31 දිනට අඩු නොකොට ඉතිරිව ඇති යම් යෙදවුම් බද්දක් වේ නම් එය පහත සීමාවන්ට යටත්ව සෑම මසකම නිමැවුම් බදුවලින් අඩු කරනු ලැබිය හැක.

- එකතු කළ අගය මත බදු පනතේ අදාල විධි විධානවලට යටත්ව ගණනය කරන ලද 2010.12.31 දිනට අඩු නොකරන ලද එකතු කළ අගය මත බද්දේ මුළු යෙදවුම් බදු අගයෙන් 10% ක් ; හෝ
- ගෙවිය යුතු එකතු කළ අගය මත බදු පවතී නම් එම අගයෙන් 5% ක් (යෙදවුම් බදු අඩු කිරීමෙන් පසු)

යන අගයන් දෙකෙන් අඩු අගය.

කෙසේ වෙතත්, ඉඩදිය හැකි මෙකී මුළු බදු බැර බදු කාල පරිච්ඡේදය සඳහා නිමැවුම් බද්දෙන් 100% ක් නොඉක්මවිය යුතුය.

➢ 2010.12.31 දිනට පසුව වන සැපයුම්, එකතු කළ අගය මත බද්දෙන් නිදහස් වන්නේ නම් හෝ වෙනත් යම් හේතුවක් නිසා එකතු කළ අගය මත බදු ගෙවීමට යටත් නොවන්නේ නම් එසේ අඩු නොකරන ලද එකතු කළ අගය මත යෙදවුම් බදු බැර ඉහතකී සීමාවන්ට යටත්ව, විදුලි සංදේශන බද්ද හෝ ගෙවිය යුතු ආදායම් බද්ද, ආර්ථික සේවා ගාස්තුව හෝ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් යටතේ පාලනය වන වෙනත් බද්දකට හිලව් කරනු ලැබිය හැකිය.

➢ එකතු කළ අගය මත බද්ද හෝ වෙනත් යම් බද්දක් (දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් යටතේ පාලනය වන හෝ විදුලි සංදේශන බද්ද) ගෙවීමට යටත් නොවන්නේ නම් එවැනි හිලව් නොකළ එකතු කළ අගය මත යෙදවුම් බදු රේගුවේදී ගෙවිය යුතු බදු වලින් 5% කට යටත්ව (එකී රේගුවේදී ගෙවිය යුතු බදු සඳහා) හිලව් කළ හැකිය.

**ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකට ගෙවීම් කළ හැකිය.**
**කරුණාකර චෙක්පතේ පිටුපස බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය (TIN) හා බදු කාල සීමාව සඳහන් කරන්න.**

**වැඩිදුර පැහැදිලි කර ගැනීම් සඳහා පහත දුරකථන අංකයන්ට අමතන්න.**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| එකතුකළ අගය මත බදු අංශය | - | දුරකථන : | 011 - 2338541, | 011 - 2134103, | 011 - 2134102 | |
| මූල්‍ය සේවා අංශය | - | දුරකථන : | 011 - 2134402, | 011 - 2134404, | 011 - 2134405 | |
| බදු සේවා අංශය | - | දුරකථන : | 011 - 2134171, | 011 - 2134172, | 011 - 2134173, | 011- 2135135 |
| ලේකම් අංශය | - | දුරකථන : | 011 - 2135412, | 011 - 2135413, | 011 - 2135412 | |

දේශීය ආදායම් වෙබ් අඩවිය - www.inlandrevenue.gov.lk

**කරුණාකර කලට වේලාවට ගෙවීම් කරන්න.**

**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

බදු - වඩා හොඳ අනාගතයකට